# ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025)

**(ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ / මධ්‍යම / සාමාන්‍ය උපාධි)**

# මාර්ගගතව අයදුම්පත් යොමුකිරීම සඳහා උපදෙස්

ආයතනික විභාග සංවිධාන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

පැලවත්ත, බත්තරමුල්ල.

# පටුන


**01.** සාමාන්‍ය තොරතුරු

1.1 ලියාපදිංචි පිරිවෙන්

1.2 ලියාපදිංචි අංකය

1.3 පරිශීලක නාමය හා මුරපදය

1.4 තොරතුරු යාවත්කාලීන කිරීම

1.5 නව පිරිවෙන් ලියාපදිංචි කිරීම

1.6 විභාගය පැවැත්වෙන නගර ලේඛනය

**02.** අයදුම්පත් ඉදිරිපත් කිරීම

2.1 පොදු උපදෙස්

2.2 ඌන සාමර්ථ්‍යය

2.3 විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්

**03.** විභාග ගාස්තු

**04.** ප්‍රවේශ පත්‍ර බාගත කිරීම

**05.** විභාග ප්‍රතිඵල

5.1 ප්‍රතිඵල සටහන් වන ආකාරය

5.2 ප්‍රතිඵල ලේඛන ලබා ගැනීම

**06.** නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම

**07.** විමසීම්

7.1 දුරකථන අංක

7.2 විද්‍යුත් තැපැල් ලිපින

## 01. සාමාන්‍ය තොරතුරු:

### 1.1 ලියාපදිංචි පිරිවෙන්

| දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය | ලියාපදිංචි පිරිවෙන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | මූලික | මහ | විද්‍යායතන | වෙනත් |
| 01 | කොළඹ | 34 | 11 | 03 | 03 |
| 02 | ගම්පහ | 36 | 24 | 04 | 04 |
| 03 | කළුතර | 31 | 10 | 08 | 02 |
| 04 | මහනුවර | 46 | 26 | 08 | 02 |
| 05 | මාතලේ | 12 | 11 | 01 | - |
| 06 | නුවරඑළිය | 06 | 04 | 01 | - |
| 07 | ගාල්ල | 50 | 19 | 04 | 02 |
| 08 | මාතර | 49 | 13 | 07 | - |
| 09 | හම්බන්තොට | 29 | 10 | 01 | - |
| 12 | වවුනියාව | 01 | - | 01 | - |
| 13 | මුලතිව් | 01 | - | - | - |
| 15 | මඩකලපුව | - | - | 01 | - |
| 16 | අම්පාර | 16 | 05 | - | - |
| 17 | ත්‍රිකුණාමලය | 06 | 01 | - | - |
| 18 | කුරුණෑගල | 40 | 40 | 06 | 01 |
| 19 | පුත්තලම | 08 | 06 | - | - |
| 20 | අනුරාධපුරය | 27 | 15 | 03 | 01 |
| 21 | පොළොන්නරුව | 08 | 07 | - | - |
| 22 | බදුල්ල | 27 | 11 | 03 | 01 |
| 23 | මොනරාගල | 19 | 06 | 02 | - |
| 24 | රත්නපුර | 37 | 10 | 05 | - |
| 25 | කෑගල්ල | 19 | 19 | 06 | - |
| | **එකතුව** | **502** | **248** | **63** | **16** |

### 1.2 ලියාපදිංචි අංකය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි සියලු පිරිවෙන් (මූලික පිරිවෙන්/ මහ පිරිවෙන් / විද්‍යායතන පිරිවෙන් / සීලමාතා අධ්‍යාපන ආයතන සහ විශේෂ පිරිවෙන්) සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පරිගණක අංකයක් නිකුත් කර ඇත. මෙම විභාගය සඳහා මූලික පිරිවෙන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ නොහැක.

### 1.3 පරිශීලක නාමය හා මුරපදය

පිරිවෙන් වෙත ලබා දෙන පරිශීලක නාමය (User Name) හා මුර පදය (Password) මේ වන විට නිකුත් කර ඇත. සියලුම පිරිවෙන් විභාග සඳහා ඉදිරියේදී මෙම පරිශීලක නාමය (User Name හා මුරපදය (Password) භාවිත වන බැවින් එය පරිවෙනාධිපතිවරුන් සතුව සුරක්ෂිතව තබාගත යුතු වන අතර අන්සතු කිරීමෙන් වැළකිය යුතුය.

### 1.4 තොරතුරු යාවත්කාලීන කිරීම

පිරිවෙන වෙත ලබාදී ඇති පරිශීලක නාමය හා මුර පදය භාවිත කර Piriven Exams පද්ධතියට පිවිසීමෙන් පසු පිරිවෙනේ ලිපිනය, දුරකථන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය, පරිවෙනාධිපතිවරයාගේ නම ආදී තොරතුරු යාවත්කාලීන කළ යුතු වේ. පිරිවෙනේ නම සංශෝධනය කිරීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශය හරහා අයදුම් කළ යුතුය.

### 1.5 නව පිරිවෙන් ලියාපදිංචි කිරීම

නව පිරිවෙන් ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශය මඟින් අයදුම් කළ යුතුය. එහිදී එක් ලිපිනයක් යටතේ ලියාපදිංචි කළ හැක්කේ එක් පිරිවෙනක් පමණි.

### 1.6 විභාගය පැවැත්වෙන නගර ලේඛනය

| නගර අංකය | නගරය |
|---|---|
| 101 | කොළඹ |
| 201 | ගම්පහ |
| 301 | කළුතර |
| 401 | මහනුවර |
| 501 | මාතලේ |
| 701 | ගාල්ල |

| නගර අංකය | නගරය |
|---|---|
| 801 | මාතර |
| 901 | හම්බන්තොට |
| 1801 | කුරුණෑගල |
| 1802 | වාරියපොල |
| 2001 | අනුරාධපුරය |
| 2101 | පොළොන්නරුව |
| 2201 | බණ්ඩාරවෙල |
| 2301 | මොනරාගල |
| 2401 | රත්නපුර |
| 2501 | කෑගල්ල |

සැ.යු. - ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නගරවල විභාග මධ්‍යස්ථාන අවලංගු කිරීමට සිදුවන බැවින් මනාප නගර දෙකක් සඳහන් කළ යුතුය.

## 02. අයදුම්පත් ඉදිරිපත් කිරීම

- ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2024 (2025) සඳහා මාර්ගගතව අයදුම්පත් භාර ගැනීම 2025 පෙබරවාරි මස 19වන දින පෙ.ව. 09.00 ට ආරම්භ වන අතර 2025 මාර්තු මස 05වන දින ප.ව. 09.00 ට අවසන් වේ. අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර විභාග නිවේදනයේ සහ මෙහි සඳහන් පොදු උපදෙස් හා තාක්ෂණික උපදෙස් කියවා අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

- පිරිවෙන් අයදුම්කරුවන් පරිවෙනාධිපති මඟින් ද පෞද්ගලික අයදුම්කරුවන් පෞද්ගලිකව ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

## 2.1 පොදු උපදෙස්

I. මාර්ගගත විභාග අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක් පිරවිය යුතුය.

II. මාර්ගගත අයදුම්පතේ සඳහන් සියලුම කොටස් මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කළ යුතුය.

III. පිරිවෙනේ ලිපිනය, ප්‍රධානාචාර්යවරයාගේ තොරතුරු, දුරකථන අංක සහ පිරිවෙන අයත් දිස්ත්‍රික්කය සහ විභාගයට පෙනී සිටීමට අවශ්‍ය වන නගර දෙකක් අනිවාර්යෙන්ම සඳහන් කළ යුතු වේ. විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී නොසිටින අවස්ථාවලදී අදාළ අයදුම්කරුවන් ඊට ආසන්න නගරයේ පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ.

IV. පද්ධතියට නම් ඇතුළත් කිරීමේදී පැවිදි අයදුම්කරුවකු නම් සාමණේර සහතිකයේ නම / ගිහි අයදුම්කරුවකු නම් උප්පැන්න සහතිකයේ නම සඳහන් ආකාරයටම විය යුතු අතර, ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. (සැ.යු.- පැවිදි අයදුම්කරුවන්ගේ උප්පැන්න සහතිකයේ සඳහන් නම ඇතුළත් කිරීම සඳහා වෙනම තීරුවක් ලබා දී ඇත.)

V. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයා කැමැති එක් භාෂා මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය හැක.

VI. අයදුම්පත යොමු කිරීමට (Submit) පෙර ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි බව හා දී ඇති උපදෙස් අනුව සම්පූර්ණ කර තිබේදැයි පරීක්ෂා කර තහවුරු කර ගන්න.

VII පරිවේණාධිපති විසින් පිරිවෙන් අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කර බැංකු හර/ බැර කාඩ්පතක් (Debit/ Credit) මඟින් ගෙවිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවන් පෞද්ගලිකව බැංකු හර/ බැර කාඩ්පතක් (Debit/ Credit) මඟින් විභාග ගාස්තු ගෙවිය යුතුය.

VIII අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර ( Special Characters) වන “ ” ? :{}[ ] ‘ !`~#$%^*<> = + - _ / නොයෙදිය යුතුය. එවැනි විශේෂිත අක්ෂර යොදා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IX අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සහිත මාර්ගගත අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

X පිරිවෙන් ප්‍රධානීන් විසින් අදාළ ශිෂ්‍යයින්ගෙන් පෞද්ගලිකව විමසා තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

XI මාර්ගගතව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අයදුම්පත pdf ක්‍රමයට බාගත (download) කර ගත හැකි අතර එම පිටපත පසුව කරන විමසීම් සඳහා සුරැකිව තබා ගන්න.

XII අයදුම්පත් සම්පූර්ණ කරන අවස්ථාවේදී අයදුම්කරුවන් අයදුම් කරන විෂය හා මාධ්‍ය පිළිබඳ අවබෝධයකින් යුතුව සඳහන් කළ යුතු අතර කවර හේතුවක් නිසාවත් විභාගය පැවැත්වෙන අවස්ථාවේදී අයදුම් කර ඇති මාධ්‍ය හා විෂයන් වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

## 2.2 ඌන සාමර්ථ්‍යය

### 01. ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ විභාගය

ප්‍රධාන විෂයත්‍රය සඳහා එක්වර පෙනී සිට සමත් විය යුතුය. යම් හෙයකින් නියමිත ප්‍රශ්න පත්‍ර හයෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වූ විට අදාළ විෂය සඳහා සම්පූර්ණයෙන් පෙනී සිට සමත් විය යුතුය. මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත්ව අනුයාත වර්ෂ තුනක් තුළ විභාගය සම්පූර්ණ කළ යුතුය.

### 02. ප්‍රාචීන පණ්ඩිත මධ්‍යම විභාගය

ප්‍රධාන විෂයත්‍රය සඳහා එක්වර පෙනී සිට සමත් විය යුතුය. එක් විෂයයක ප්‍රශ්න පත්‍ර තුනෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් අදාළ ප්‍රශ්න පත්‍රය පමණක් අසමත් ලෙස සැලකේ. එක් විෂයයකින් එක් ප්‍රශ්න පත්‍රයකට වඩා අසමත් වුවහොත් ආළ විෂය අසමත් ලෙස සැලකේ. එසේ අසමත් වන ප්‍රශ්න පත්‍රයෙන් හෝ ප්‍රශ්න පත්‍රවලින් සාමර්ථ්‍යය ලබා විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත්ව අනුයාත වර්ෂ පහක් ලැබේ.

### 03. ප්‍රාචීන පණ්ඩිත සාමාන්‍ය උපාධි විභාගය

ප්‍රධාන විෂයත්‍රය සඳහා එක්වර පෙනී සිට සමත් විය යුතුය. එක් විෂයයක ප්‍රශ්න පත්‍ර හතරෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් අදාළ ප්‍රශ්න පත්‍රය පමණක් අසමත් ලෙස සැලකේ. එසේ අසමත් වන ප්‍රශ්න පත්‍රයෙන් හෝ ප්‍රශ්න පත්‍රවලින් සාමර්ථ්‍යය ලබා විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත්ව අනුයාත වර්ෂ හතක් ලැබේ.

## 2.3 විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්

විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා අයදුම්කරුවන් ඇතුළත් කරන අවස්ථාවේදී එම පෝරමය මඟින් ඔවුන්ගේ තොරතුරු ලබා ගැනේ. එය නිවැරදිව සම්පූර්ණ කිරීම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීමට පහසුවක් වේ.

## 03. විභාග ගාස්තු

සියලුම පිරිවෙන් අයදුම්කරුවන් පළමු වර විභාගයට පෙනී සිටීමේදී පමණක් විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවන අතර ඉන් පසුව විභාගයට පෙනී සිටින සෑම වරකදීම විභාග ගාස්තු ගෙවිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවන් පළමු වර විභාගයට පෙනී සිටීමේදී ද විභාග ගාස්තු ගෙවිය යුතු වේ. සියලු අයදුම්කරුවන් විභාග ගාස්තු ගෙවිය යුත්තේ බැංකු හර/ බැරපතක් (Debit/ Credit) මඟින් පමණි.

| | | |
|---|---|---|
| ප්‍රාචීන ප්‍රාරම්භ | සම්පූර්ණ විභාගය සඳහා | රු. 400/= |
| | එක් ප්‍රශ්න පත්‍රයකට | රු. 50/= |
| ප්‍රාචීන මධ්‍යම | සම්පූර්ණ විභාගය සඳහා | රු. 600/= |
| | එක් ප්‍රශ්න පත්‍රයකට | රු. 50/= |
| ප්‍රාචීන අවසාන | සම්පූර්ණ විභාගය සඳහා | රු. 750/= |
| | එක් ප්‍රශ්න පත්‍රයකට | රු. 50/= |

## 04. ප්‍රවේශ පත්‍ර බාගත කිරීම

ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් අනතුරුව පිරිවෙන වෙත ලබා දී ඇති පරිශීලක නාමය හා මුරපදය භාවිත කර මාර්ගගත පද්ධතියෙන් ප්‍රවේශ පත්‍ර බාගත කළ හැකිය.

## 05. විභාග ප්‍රතිඵල

### 5.1 ප්‍රතිඵල සටහන් වන ආකාරය

A - විශිෂ්ට සාමර්ථ්‍යය

B - අධිසම්මාන සාමර්ථ්‍යය

C - සම්මාන සාමර්ථ්‍යය

S - සාමාන්‍ය සාමර්ථ්‍යය

W - දුර්වල

\+ - නොපැමිණි

N - විෂයයේ ප්‍රතිඵල අත්හිටුවා ඇත.

### 5.2 ප්‍රතිඵල ලේඛන ලබා ගැනීම

පිරිවෙන් අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ පිරිවෙන් වෙත හා පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛන පෞද්ගලික ලිපිනය වෙත තැපැල් මගින් එවනු ලැබේ.

## 06. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීම

පරිවෙනාධිපතිවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

## 07. විමසීම්

### 7.1 දුරකථන අංක

| | |
|---|---|
| ආයතනික විභාග සංවිධාන ශාඛාව | - 011 278 5230 / 011 278 6150 |
| | - 011 366 1244 |
| ෆැක්ස් | - 011 278 4232 |
| මාර්ගගත ඒකකය (තාක්ෂණික උපදෙස්) | - 011 366 1122 / 011 367 1568 |
| | - 011 366 1246 |
| පිරිවෙන් අධ්‍යාපන අංශය | - 011 278 5141 / 011 278 4910 |
| | - 011 278 4893 |

### 7.2 විද්‍යුත් තැපැල් ලිපින

| | |
|---|---|
| ආයතනික විභාග සංවිධාන ශාඛාව | - intexorganizations@gmail.com |
| මාර්ගගත ඒකකය (තාක්ෂණික උපදෙස්) | - doeonlineexams@gmail.com |

***